*7 වන පිටුවෙන් (ගුණදාස අමරසේකර ගැන)*

ක්‍රමයක්, ඒ දෙසට අපි යා යුතුයි කියන එකයි. කලාකරුවාට ඒ ඒ අය කියන විදියට ආපස්සට යන්න පුළුවන් කමක් නැ. අනෙක් අතට නූතන තාක්ෂණය දෝරේ ගලාගෙන එද්දී අතීතයට නිකම්ම අක්ෂ ගැසීමෙන් ඇති වන සුභසිද්ධියක් නෑ. මනුස්සයා නූතන සමාජයට ඇතුල් වුනේ යුරොපයේ ඇති වුණ සමාජ පෙරලි හරහායි. ඒ මගින් සූරාකෑමේ සමාජ තට්ටු තුනක අන්තිම අවධිය හැටියටයි ධනපති සමාජය ඇති වුනේ. නිදහස්, සාමකාමී, පරිසරවාදී ස්වභාවධර්මයට ඓන්ද්‍රිය ලෙස බද්ධ වුණ ඉංදීය ගම්මාන ඇතුළු ලෝකයේ සෑම සමාජයක්ම මේ ධනපති සමාජය විසින් ඒකාබද්ධ කරල ඉවරයි. ගෝලීය ධනවාදී ප්‍රපාතය ලෝකයම ගිලගෙන ඉවරයි. ඇත්ත තමයි, පරිසරවාදී, නිදහස්, ස්වභාවධර්මයට යළි ඇතුල් වුණ අලුත් සහෝදරත්ව සමාජයක් අවශ්‍යයි. එය ලබාගැනීම අපේ ඉතිහාසය ගැන කඳුළු සැලීමෙන් කරන්න බෑ. ඒකට ජනතාවාදී නිදහස් සටනක් මනුස්සකම මුල් කරල කරන්න ඕනෑ. ඒත් ගුණදාස දැන් කියන්නේ මනුස්ස සටනට එරෙහිව සිංහල ජාතික සටනක් කළ යුතුයි කියලයි. දක්ෂ කලාකරුවෙක් මේ වගේ වල්භූත දොඩවන තැනකට පත්වීම හරිම කණගාටුදායක දෙයක්.

මේකේ වඩාත්ම නරක පැත්ත සිංහල සම්ප්‍රදායය වෙනුවෙන් දෙමළ සම්ප්‍රදායයට විරුද්ධ වීමයි. මේ රටේ ගොඩනැගුණ දෙමළ සම්ප්‍රදායය මේ රටටම අයිති වෙනම අගනා දෙයක් හැටියට වත් සලකන්න ගුණදාසට බැරි වීම එක්තරා රෝගී තත්වයක් කියල කියන්න පුළුවන්. මෑත යුගයේ ගුණදාස කර තිබූ හැම දෙයකටම මේ රෝගී තත්වය ඇතුල් වෙලා තියෙනව. ඔහුගේ නායකයා හැටියට විමල් වීරවංශ තෝරා ගැනීමෙන්ම ඔහුගේ මානසික වහල්භාවය එළිදරව් වෙනවා. බුද්ධිමතෙක් හැටියට ගත්තත් ගුණදාස හා විමල් එක් තැන තියන්න බෑ. ඊළඟට මේ ආණ්ඩුව ඉතාම පහත් විදියට ගෝලීය බලවතුන්ට රටේ අයිතීන් සින්න කර දෙන ආණ්ඩුවක්. රනිල් වික්‍රමසිංහට කවදාවත් කරන්න බැරි වුණ මට්ටමට අද මේ රට ගෝලීය ධනවාදී ණයකරයකට යට කරල තියෙන්නේ. අපේම දෙමළ ජනතාවට හිමි නිසි තැන දෙන්නට නොහැකි වීම නිසා අපි වෙනුවෙන් අපිම හෑල්ලුවට විනාශයට ලක් වුණා. අපි කවුද, අපේ ගම මොකක්ද, කියල අපටම හොයා ගන්න බැරි තැනට ගුණදාස අපිව පත් කළා. මේ ළඟදී එයා ලියපු හැම දෙයකින්ම කළේ අපි වෙනුවෙන් අපිම අපේකම නැති කරගත්ත එකයි. අපි කවුද, අපි සිංහල පමණක්ද? එහෙනම් දෙමළ සම්ප්‍රදාය, භාරත සම්ප්‍රදායයන්, මෝගල් සම්ප්‍රදායයන්, කතෝලික සම්ප්‍රදායයන් මේවා අපි නෙවෙයිද? ආපහු හැරිල කලාව, සංගීතය, සාහිත්‍යය මේ සියල්ල දිහා ගුණදාසගේ ඇහෙන් බැලුවහම, අපිට කිසි දෙයක් තේරුම් ගන්න බැරි තැනකට පත් වෙනවා.

ගුණදාස නම් මහා කවියා අවසාන වශයෙන් මේ සිංහල සමාජයම අතරමං කළ, තමා පත්තු කළ පහන තමා අතින්ම නිවා පහනත් කැලයට විසි කළ, නිවට බමුණෙකුගේ තත්වයට වැටිලා කියලයි මං කියන්නේ.

[redacted]

GATEWAY
LAWYERS

- Advice on Legal Matters
- Business & Commercial Law
- Sale of Business
- Conveyancing
- Powers of Attorney
- Wills & Estate Planning
- Migration Law

Senanie Kurukularatne LL.B
Barrister & Solicitor
Attorney-at-Law Sri Lanka
Registered Migration Agent
MARN 0854193

T 03 8786 9682
F 03 8786 9681
M 0414 660 513
gateway5@bigpond.net.au
DX 30463 Berwick VIC 3806
PO Box 730 Berwick VIC 3806
17 Glenview Rise Berwick VIC 3806 Australia

We listen to you like a friend...
We advise you like a father...
Your negligence is our pain....

..Please
do not
Drink&
Drive..

This campaign
against irresponsible drinking
is sponsored by

FAIRFIELDS IMMIGRATION LAWYERS
Melbourne.